www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

# Royal College - Colombo 07
රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021
පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 1
Time :1 hour

| 44 | S | I |
|---|---|---|

## Dancing – I
නර්තනය – I

Name :- ..................................................... Grade : -................ Index number:-....................

❖ **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

● **1 සිට 10 දක්වා ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.**

1. වන්නමක .................... මගින් එහි නාදමාලාව පිළිබිඹු වේ.
   (1) බෙර පදය (2) ප්‍රස්තාරය (3) තානම (4) තිත

2. මහනුවර ඇසල පෙරහැර මුල් දින පහ වීදි සංචාරය කරනු ලබන්නේ .................... පෙරහැර නමිනි.
   (1) කුඹල් (2) රන්දෝලි (3) නවම් (4) වේල්

3. පිළිකුල, ආදරය, දුක වැනි හැඟීම් .................... අභිනයෙන් නිරූපණය කෙරේ.
   (1) වාචික (2) ආංගික (3) සාත්වික (4) ආහාර්ය

4. නර්තන ශිල්පියකු .................... කිරීමේ දී සමේ වර්ණය පිළිබඳ සැලකිලිමත් විය යුතු යි.
   (1) අංග රචනය (2) රංග රචනය
   (3) තිර රචනය (4) රේඛා රචනය

5. සරස්වතී මණ්ඩපය, පොළොන්නරු යුගයේ දී .................... රජු විසින් ඉදිකළ බව චූලවංශයේ සඳහන් වේ.
   (1) දෙවන පරාක්‍රමබාහු (2) දෙවන රාජසිංහ
   (3) කීර්ති ශ්‍රී රාජසිංහ (4) පළමු වන පරාක්‍රමබාහු

6. චාමර ගායනවට අයත් සෙබවන් .................... එතැනට කවි පදයක්,
   (1) රජවරු දෙදෙනෙක් (2) පඬිවරු දෙදෙනෙක්
   (3) දෙවිවරු සදෙනෙක් (4) රජවරු තිදෙනෙක්

7. ජන නැටුමක් වන .................... නැටුම සිංහල, ද්‍රවිඩ, මුස්ලිම් ජනයා අතර වඩාත් ජනප්‍රිය නැටුමකි.
   (1) ලී කෙළි (2) බුම්මැඩි (3) කොහොඹ කළය (4) වේවැල්

8. මුල්ම සිංහල ප්‍රශස්ති කාව්‍යය ලෙස පිළිගනු ලබන්නේ .................... ය.
   (1) ශ්‍රී නාමය (2) පවන
   (3) පැරකුම්බා සිරිත (4) ශෘංගාලංකාරය





agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

9. ප්‍රස්තාරකරණයේ දී ඇදෙන මාත්‍රා හඳුන්වනු ලබන්නේ .................... නමිනි.
(1) දෘත මාත්‍රා (2) ප්ලුත මාත්‍රා (3) ලඝු මාත්‍රා (4) ගුරු මාත්‍රා

10. තූර්ය භාණ්ඩ වර්ගීකරණයේ දී විතත භාණ්ඩයක් ලෙස .................... ගැනේ.
(1) සොෂක බෙරය (2) දඬු බෙරය
(3) දවුල් බෙරය (4) උඩැක්කි බෙරය

● 11 සිට 13 දක්වා ප්‍රශ්න සඳහා වගුව ඇසුරින් පිළිතුරු තෝරන්න.

| | I තීරුව | II තීරුව | III තීරුව | IV තීරුව |
|---|---|---|---|---|
| A | චිත්‍රසේන ඩයස් | ඩබ්.ඩී. අමරදේව | කමලා ජයතිලක | වසන්ත කුමාර |
| B | ඉතාලිය | ඉසඩෝරා | ඇනා පැව්ලෝනා | වස්ලව් නිජින්ස්කි |
| C | ප්‍රංශය | ඇස්. පණිභාරත | ප්‍රේම කුමාර | මාරියස් පෙරේරා |
| D | රුසියාව | චෛකොස්කි | සිරිමතී රසාදරී | එංගලන්තය |

11. ගුහ අපලය සහ පරෙවිය යන මුද්‍රා නාට්‍ය නිර්මාණකරුවන් සඳහන් වන්නේ,
(1) II සහ III තීරුවල C පේළිය (2) III සහ IV තීරුවල D පේළිය
(3) I සහ II තීරුවල A පේළිය (4) I සහ IV තීරුවල A පේළිය

12. බැලේ නර්තනය ප්‍රභවය වූ රට සහ හංස ධේනුවගේ චරිතය රඟපෑ නිළියන් දක්වෙන්නේ,
(1) I සහ IV තීරුවල C පේළිය (2) I සහ III තීරුවල D පේළිය
(3) I සහ III තීරුවල B පේළිය (4) II සහ II තීරුවල B පේළිය

13. ලෝක ප්‍රකට හංසවිල බැලේ නාට්‍යය නිෂ්පාදනය කළ රට සහ එහි සංගීතඥයා දක්වෙන්නේ,
(1) I සහ II තීරුවල D පේළිය (2) I සහ II තීරුවල B පේළිය
(3) I සහ II තීරුවල C පේළිය (4) I සහ III තීරුවල B පේළිය

14. උඩරට නර්තනයක් කස්තිරමකින් අවසන් කරන්නේ නම්, සබරගමු හා පහතරට නර්තනයක් අවසන් කරන කොටස,
(1) ඉරට්ටිය හා කලාසම වේ. (2) අඩව්ව හා කලාසම වේ.
(3) ඉරට්ටිය හා අඩව්ව වේ. (4) කලාසම හා ඉරට්ටිය වේ.

15. දක්ෂිණ භාරතීය කථකලී නර්තනයේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙස හැඳින්වෙන්නේ,
(1) මෘදංගය, මද්දලය, එඩැක්ක (2) මද්දලය, චෙන්ඩාව, එඩැක්ක
(3) මද්දලය, මෘදංගය, නාගස්වරම් (4) මද්දලය, වයලීනය, චෙන්ඩාව

16. භරත නාට්‍යයම් සංදර්ශනයක දැකිය හැකි නර්තනාංගය වේ.
(1) ජතීස්වරම්, මේලප්පදම්, ශිවම් (2) කෞතුවම්, පදම්, මේලප්පදම්
(3) ශබ්දම්, පදම්, වර්ණම් (4) කෞතුවම්, ශිවම්, පදම්



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

17. ''ආයුබෝ වේවා - කල සෙත් මුදුන් වේවා'' මෙය,
    - (1) ආශිර්වාද කවියකි.
    - (2) සෙත් කවියකි.
    - (3) වස් කවියකි.
    - (4) සිරසපාද කවියකි.


18. නර්තන කලාවට අධිපති දෙවියන් වන්නේ,
    - (1) ගණපති
    - (2) සරස්වතී
    - (3) ක්‍රිෂ්ණා
    - (4) නටරාජා

19. මාත්‍රා 2 + 2 + 2 + 4 තාල රූපයට තාලම්පට වාදනය කෙරෙන්නේ,
    - (1) තිත්, තෙයි, තිත්, තෙයි
    - (2) තිත්, තිත්, තිත්, තෙයි
    - (3) තිත්,තිත්, තෙයි, තෙයි
    - (4) තිත්, තෙයි, තෙයි, තෙයි

20. නර්තනාංගයක රසඥතාවය සඳහා වඩාත් වැදගත් වන්නේ කුමන නර්තන ඇසුරු කිරීම ද?
    - (1) දේශීය නර්තන
    - (2) අනුකරණාත්මක නර්තන
    - (3) උසස් ගණයේ නර්තන
    - (4) ප්‍රාසාංගික නර්තන

21. සම්ප්‍රදායන් තුනට අයත් වන්නම් නර්තනයේ දී චලන යොදා ගනී,
    - (1) සංචාරී
    - (2) ප්‍රකාශනාත්මක
    - (3) රිද්මයානුකූල
    - (4) තාලානුකූල

- දී ඇති රූප සටහන ඇසුරෙන් පිළිතුරු සපයන්න,




22. A අකුරෙන් දක්වෙන්නේ ගැටබෙරයේ,
    - (1) බෙර කඳයි.
    - (2) කැපුම් හමයි.
    - (3) බෙර ලණුවයි.
    - (4) බෙර හැක්මයි.

23. B අකුරෙන් දක්වෙන්නේ,
    - (1) රියනකි
    - (2) විග්ගුස්සකි
    - (3) අඟලකි
    - (4) වියතකි

24. කැලණිය විශ්වවිද්‍යාලයීය සෞන්දර්ය අධ්‍යයන ආයතනය සෞන්දර්ය කලා විශ්වවිද්‍යාලය බවට පත් වූයේ,
    - (1) 1972 වර්ෂයේ දී ය.
    - (2) 1974 වර්ෂයේ දී ය.
    - (3) 2005 වර්ෂයේ දී ය.
    - (4) 1978 වර්ෂයේ දී ය.

- පහත රූප ඇසුරින් 25 සිට 28 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න,


A


B


C


D



agaram.lk

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!

සියලුම හිමිකම් ඇවිරිණි / *All Rights Reserved*

25. ඉහත A හා B රූපවලින් දැක්වෙන්නේ,
    (1) කථක් හා කථකලි නර්තන (2) භරත හා මනිපූරි නර්තන
    (3) කථක් හා භරත නර්තන (4) කථකලි හා භරත නර්තන

26. ඉහත නර්තන අංග පිළිවෙළින් දැක්වූ විට,
    (1) භරත, කථක්, මනිපූරි, කථකලි (2) භරත, කථක්, කථකලි, මනිපූරි
    (3) කථක්, කථකලි, මනිපූරි, භරත (4) කථක්, භරත, කථකලි, මනිපූරි

27. නට්ටුවහාර් සංගීතය සපයන්නේ ඉහත රූප අතුරින්,
    (1) A ට (2) C ට (3) B ට (4) D ට

28. උත්තර භාරතයේ ප්‍රචලිත නර්තන අංගයකි,
    (1) A රූපය (2) B රූපය (3) C රූපය (4) D රූපය

29. පහතරට නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග ලෙස සැලකෙන්නේ,
    (1) තෙල්මෙ, ආවැන්දුම, ශුද්ධ මාත්‍රය (2) තෙල්මෙ, දෙවොල්, ශුද්ධ මාත්‍රය
    (3) නානුමුරය, අස්නෙ, ශුද්ධ මාත්‍රය (4) දෙවොල්, අස්නෙ, ශුද්ධ මාත්‍රය

30. දවුල් වාදනයට අදාළ පද කොටසක් වන්නේ,
    (1) කුදත් තක්කිට තකට ජිමිතකු (2) දිත්තම් දිතකු දොම් දොම් ගතා
    (3) දොං ජිං ජිං තකට දොංතක (4) කුංත ගත ගත ගත්ත කුද කුද

31. දුම්මල පාළිය නර්තනයට ගැනෙන රංග භාණ්ඩයකි,
    (1) අඟුරු කබල යි. (2) ඊතලය යි.
    (3) පන්දම යි. (4) කොතලය යි.

32. ''උඩරට නර්තන කලාව'' කෘතිය ලියා පළ කර ඇත්තේ,
    (1) මුදියන්සේ දිසානායක (2) කේ.එස්. ප්‍රනාන්දු
    (3) ඩබ්.බී. මකුලොලුව (4) ජේ.ඊ. සේදරමන්

33. කෝලම් නාට්‍ය චරිත නිරූපණයේ දී හමුවන අධිමානුෂික චරිත වේ
    (1) නාග රාක්ෂ, වලස් (2) නාග රාක්ෂ, කාපිරි
    (3) ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ (4) ගුරුළු රාක්ෂ

34. සබරගමුවට අයත් රත්නපුර සමන් දේවාල පෙරහැරේ ප්‍රධාන තැනක් හිමිවන නර්තනයක් වන්නේ,
    (1) වෙස් නැටුම (2) මල් පදය
    (3) කාවඩි (4) ලී කෙළි



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

35. ''ඉතින් කියන්නේ තුන්වෙනි වරට නටන්නේ'' මෙහි කවුරුන්ගේ පැමිණීම කියාපායි ද?

(1) පරයා (2) සොකරි (3) වෙදා (4) ගුරුවා

36. ශාන්තිකර්මවල අයත් දෙබස් සංවාද අයත් වන්නේ,

(1) ආහාර්ය අභිනයට (2) සාත්වික අභිනයට

(3) වාචික අභිනයට (4) ආංගික අභිනයට

37. පහත A හා B රූපවලින් දැක්වෙන්නේ,



A B

(1) සොකරි - සොත්තානා - අණබෙර - හේවා කෝළම් ය.

(2) සොකරි - පරයා - මුදලි - හේවා කෝළම් ය.

(3) ලෙන්චිනා - ජසයා - පරයා - සොත්තානා කෝළම් ය.

(4) සොකරි - වෙදරාළ - නොන්චි - අණබෙර කෝළම් ය.

38. ප්‍රාසාංගික නර්තන කණ්ඩායමක් වේදිකාවක නර්තන නිර්මාණයක් ඉදිරිපත් කිරීමේ දී වඩාත් අවධානය යොමු කළ යුත්තේ,

(1) අවකාශය හා රංගරටා භාවිතයට ය. (2) අවකාශය හා තාලරටා භාවිතයට ය.

(3) සැරසිලි හා වාදනරටා භාවිතයට ය. (4) සැරසිලි හා ගායන විධි භාවිතයට ය.

39. නන්දිකේෂ්වර විසින් රසභාව පිළිබඳ පළකරන ලද කෘතිය වන්නේ,

(1) නාට්‍ය ශාස්ත්‍රය (2) අභිනය දර්ශනය

(3) භගවත් ගීතාව ය. (4) සීලප්පදිකරම් ය.

40. ආගමික කටයුතු සඳහා භාවිත වන වාදන අවස්ථා ලෙස සැලකෙන්නේ,

(1) අණ බෙර හා රණ බෙර වාදනය (2) රණ බෙර හා මඟුල් බෙර වාදනය

(3) හේවිසි හා සේවා වාදනය (4) මල බෙර හා වද බෙර වාදනය

(ලකුණු 1 x 40 = 40)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / All Rights Reserved

**Royal College - Colombo 07**

රාජකීය විද්‍යාලය - කොළඹ 07

## Grade 11 – First Term Test – June 2021

පළමු වාර පරීක්ෂණය - 2021 ජුනි - 11 ශ්‍රේණිය

කාලය : පැය 2
**Time : 2 hours**

| 44 | S | II |
|---|---|---|

## Dancing – II
## නර්තනය – II

Name :- ..................................................... Grade : -................ Index number:-...................

- **සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**
- **පළමු වන ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු වන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න 4ක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

(1) (i) ලී කැටයම් කළ නලඟනන්ගේ රූකම් .................... දේවාලයෙන් සොයාගත හැක.

(ii) අ.පො.ස. (සා/පෙළ) විෂය මාලාවට නැටුම් විෂයය එක් වූයේ .................... වර්ෂයේ දී ය.

(iii) ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජුගේ නෘත්‍ය මම්ඩලයට වන්නම් රචනා කරන ලද්දේ .................... විසිනි.

(iv) ගොයම් කැපීමේ නර්තනය වේදිකාව සඳහා නිර්මාණය කරන ලද්දේ .................... විසිනි.

(v) විසිවන සියවසේ මුල් භාගයේ උඩරට නර්තන කලාවේ වෙස් බැඳි කාන්තාවන් දෙදෙනෙකි

1 ....................................... 2.......................................

(vi) සතර අභිනයේ දී වේදිකා සැරසිලි .................... අභිනය නමින් ද, ගීත ගායනා .................... නමින් ද හැඳින්වේ.

(vii) වෙස් නර්තනයෙහි .................... ලක්ෂණ පවතින අතර ගිරිදේවි නර්තනයෙහි .................... ලක්ෂණ වේ.

(viii) සබරගමු ''කලාසම'' යන්නට සමාන වන උඩරට සහ පහතරට නර්තන කොටස් දෙක නම් කරන්න.

(අ) ....................................... (ආ) .......................................

(ලකුණු 12)

(2) (i) මාත්‍රා 3 + 4 තිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

(ii) මාත්‍රා 2 + 3 තිතට අයත් වන්නම් කවි පදයක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

(iii) මාත්‍රා 4 + 4 තිතට අයත් වන්නමක් අඩව්වක් ප්‍රස්තාර කරන්න. (ලකුණු 4)

(3) කොහොඹා කංකාරිය, දෙවොල් මඩුව, පහන් මඩුව ප්‍රධාන දේශීය ශාන්තිකර්ම ලෙස හැඳින්වේ.

(i) කොහොඹා කංකාරිය ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු හතරක් ලියා දක්වන්න. (ලකුණු 4)

(ii) එහි පූර්ව චාරිත්‍ර පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 4)

(iii) එහි ඇතුළත් නර්තන අංග 4ක් ලියා එකක් පිළිබඳ විග්‍රහ කරන්න. (ලකුණු 4)



Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk

සියලුම හිමිකම් ඇවිරිනි / *All Rights Reserved*

(4) (i) අනුරාධපුර යුගයේ නර්තන කලාව පිළිබඳ දැක්වෙන ලිඛිත මූලාශ්‍ර දෙකක් නම් කරන්න. (ලකුණු 4)

(ii) නර්තන කලාව සඳහා රාජ්‍ය අනුග්‍රහය ලැබූ බවට දඹදෙණි යුගය ඇසුරෙන් සාධකයක් ඉදිරිපත් කරන්න. (ලකුණු 4)

(iii) ගම්පළ යුගයේ නර්තන කලාව පිළිබඳ ව ඓතිහාසික සාධක දෙකක් විග්‍රහ කරන්න. (ලකුණු 4)

(5) පහත රූපරාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.



A



B



C

(i) A රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය හා රංග වස්ත්‍රාභරණ දෙකක් නම් කරන්න. (ලකුණු 4)

(ii) B රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය හා වේෂභූෂණ ක්‍රම දෙකක් නම් දක්වන්න. (ලකුණු 4)

(iii) C රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායට අයත් නර්තන අංග දෙකක් හා වාද්‍ය භාණ්ඩ දෙකක් නම්කර භාණ්ඩයක් හඳුන්වන්න. (ලකුණු 4)

(6) (i) සොකරි හා කෝලම් නාටකවල එන චරිත දෙක බැගින් නම් කරන්න. (ලකුණු 4)

(iii) කෝලම් නාටකය පැවැත්වීමේ අතීත හා වර්තමාන අරමුණු සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 4)

(iii) සොකරි රංග භාණ්ඩ හා වස්ත්‍රාභරණ පිළිබඳ විග්‍රහ කරන්න. (ලකුණු 4)

(7) මානසික ස්වස්ථතාව පවත්වාගෙන යාමට නර්තනය ද ඉවහල් වේ.

(i) ගීත අනුව නර්තන නිර්මාණය කිරීමේ දී රසවින්දනය වර්ධනය වන ආකාරය ලියා දක්වන්න. (ලකුණු 4)

(ii) ඉවසීම ප්‍රගුණ කිරීමෙහිලා නර්තනය මගින් ලැබෙන පිටිවහල උදාහරණ සහිතව දක්වන්න. (ලකුණු 4)

(iii) නිරෝගී දිවියකට නර්තනයෙන් ලැබෙන සහාය කෙබඳුදැයි විමසන්න. (ලකුණු 4)

Agaram.LK - Keep your dreams alive!

Agaram.LK - Keep your dreams alive!



agaram.lk